**ශීර්ෂය 426 - පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 සැප්තැම්බර් 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙනයනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව රාජ්‍ය අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ඇතුළත් දේපළ පිරියත හා උපකරණ ශේෂය හා ඒ හා සම්බන්ධ දේපළ පිරියත හා උපකරණ සංචිත ගිණුමේ ශේෂය අතර රු.126,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගරු අමාත්‍යතුමාගේ නිල නිවස පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් සඳහා ඉංජිනේරු සහතික කළ බිල්පත් වටිනාකම රු.1,050,000 ක් වන අතර, එම මුදල දේපළ පිරියත හා උපකරණ වැය ගිණුමට හර කර ඇත. එම වටිනාකමින් රු.126,000 ක රැඳවුම් මුදල කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් තැන්පත් (6000-0-0-16-0-148) ගිණුමට බැර කර ඇත. ඉතිරි රු.924,000 ක් කොන්ත්‍රාත්කරුට මුදලින් ගෙවන ලද වටිනාකම වේ. ඒ අනුව රැඳවුම් මුදල් තැන්පත් ගිණුමේ වටිනාකම දේපළ පිරියත හා උපකරණ සංචිත ගිණුමට ඇතුළත් නොවේ. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලේඛනයට අනුව ජංගම නොවන වත්කම්වල අගය රු.2,518,660 ක් වන නමුත් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් රු.3,732,662 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.1,214,002 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගරු අමාත්‍යතුමාගේ නිල නිවස පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමක් බැවින් එය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් වී නොමැත. තවද ගරු ඇමතිතුමාට ලබා දුන් ජංගම දුරකතනයේ වටිනාකම අතපසු වීමකින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකිවීම නිසා මෙම වෙනස පෙන්නුම් කර ඇත. එසේ වුවද අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ජංගම දුරකතනය ඇතුළත් කර ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයට වෙන්කර තිබුණු රු.38,209,600,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,372,082,993 ක් ඉතිරි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු කිරීම. |
| (ආ) | වැය විෂයන් 06 ක් සඳහා වෙන්කර තිබුණු එකතු වටිනාකම රු.1,650,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. | 2020 අගෝස්තු 09 දින අතිගරු ජනාධිපතිතුමා විසින් අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරිමෙන් පසු ශිර්ෂ 426 පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය ආරම්භ විය. එසේ අරම්භ කළ නව අමාත්‍යාංශයක් බැවින් අයවැය පුරෝකථනය කිරිමේදි පෙර වර්ෂ වල වියදම් විම සම්බන්ධව තොරතුරු නොමැති විම හේතුවෙන් යම් යම් වැය විෂයයන්වල ඉතිරි විම් සිදු වි ඇත. | -එම- |
| (ඇ) | වැය විෂයන් 09 ක සියයට 30 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රතිපාදන රු. 2,614,191 ක් ඉතිරි වී තිබුණි. | | -එම- |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ.94 අනුව බැරකම් කිසිම විටෙක ප්‍රතිපාදන ඉක්ම නොවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ වැය විෂයයන් 12 ක් යටතේ සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු1,112,692,349ක බැරකම් සඳහා බැඳීම් ඇතිකරගෙන තිබුණි. | 2020 දෙසැම්බර් මාසය දක්වා ගෙවීම් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සිදුකරන ලදි. මෙම අමාත්‍යාංශයේ ගිණුම් කටයුතු ආරම්භ කරන ලද්දේ දෙසැම්බර් මස වන අතර, 2021 වර්ෂයට අදාල ගෙවීම් කලයුතු බිල්පත් හා වවුචර් වල අගය බැරකම් වලට ඇතුළත් කර ඇත. මෙම තත්ත්වය 2020 වර්ෂයේ වැය විෂයන් වල ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනයට සමාන නොවීම ප්‍රායෝගිකව සිදුවන තත්ත්වයකි. | ඉතිරි ප්‍රතිපාදන අගය ඉක්මවා බැරකම් සඳහා බැඳීම් ඇතිකර නොගත යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 1646 | අමාත්‍යාංශය සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් පත් සහ ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 28 කට අදාළ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රටේ පවතින කොවිඩ්-19 තත්ත්වය යටතේ නිලධාරීන් කැඳවීම සීමිත වූ අතර, එම නිසා මෙවැනි අඩුපාඩු සිදු වුවත් ඉදිරියට සිදු නොවීමට කටයුතු කරන බව කරුණිකව දන්වා සිටිමි. | මු.රෙ. 1646 අනුව කටයුතු කළ යුතු වේ. |